# 2.5.1 - වන්නම්/සින්දු වන්නම් නර්තනය කරමු.

නිපුනතා මට්ටම 2.5 : නිවැරදි අංගහාර අනුගමනය කරමින් සාම්ප්‍රදායික නර්තන අංග ප්‍රදර්ශනය කරයි

ආයුබෝවන් දුවේ පුතේ,

**උඩරට වන්නම් නර්තනය**

ඔබ මීට පෙර 6 ශ්‍රේණිය සිට 8 ශ්‍රේණිය දක්වා නර්තනය විෂයට අදාලව වන්නම් නර්තනය පුහුණු වූ බව මතක ඇති. එහි දී හනුමා වන්නම, තුරගා වන්නම හා වෛරොඩි යන වන්නම් ත්‍රිත්වය ඔබ පන්ති කාමරයේ දී පුහුණු විය. එම නිසා වන්නම් පිළිබඳ මූලික අවබෝධය ඔබ සතුයි. ඒ දැනුම හා අවබෝධය අපි නැවත මෙනෙහි කර ගනිමු.වන්නමක් අපට මෙසේ අර්ථ දැක්විය හැකිය

> යම් දෙයක්, යම් සතෙක්, යම් පුද්ගලයෙක්, යම් සිද්ධියක් ගැන කෙරෙන වර්ණනාවක් නැතහොත් විස්තරයක් වන්නමක් ලෙස හැඳින්වේ.

අපේ දේශීය නර්තන සම්ප්‍රදායන් තුනෙහිම ප්‍රධාන නර්තනාංගයක් වන්නේ වන්නමය. උඩරට වන්නම් 18 ක් ද පහතරට සිංදු වන්නම් 32 ද , සබරගමු වන්නම් 18 ද ඇත. මෙම වන්නම් මුලින්ම රචනා කර ඇත්තේ ගායනය සඳහාය. පසුව නැටුම් කොටස් එකතු වී නර්තනාංගයක් බවට පත් විය.

පහත දැක්වෙන්නේ අපේ සම්ප්‍රදායන් තුනට අයත් වන්නම්වල ව්‍යුහයයි.

| උඩරට | පහතරට | සබරගමු |
|---|---|---|
| බෙර පදය | බෙර පදය | දවුල් පදය |
| තානම | තානම | තානම |
| කවිය | කවිය | කවිය |
| කස්තිරම | ඉරට්ටිය | කලාසම |
| සීරුමාරුව | | අඩව්ව |
| අඩව්ව | | |

වන්නමක නාද මාලාව පෙන්වන්නේ තානම යන කොටසිනි. අදාල තිත් රූපයට අනුව බෙර පදය තාල තබා කීමට හුරු විය යුතුය. දැන් අපි 9 ශ්‍රේණියට අදාල වන්නම් නර්තනය කෙරෙහි අවධානය යොමු කරමු.

## 1- වෙරොඩි වන්නම නර්තනය

උඩරට නර්තන සම්ප්‍රදායේ වන්නම් 18 ට ඇතුළත් මෙම වන්නමෙන් කියවෙන්නේ වෛරෝඩිය නම් මානිකාය නැත්නම් මැණිකක් පිළිබඳවයි. 8 ශ්‍රේණියේ දී මෙම වන්නම ගායනයට නර්තනයට හුරු විය. එය නැවත මෙනෙහි කරමින් සම්පූර්ණ වන්නම ගායනය හා නර්තනය කරමු. මුලින්ම ඔබ සටහන් කරගත් වන්නම නියමිත තාලයට ගායනා කිරීමට නැවතත් හුරු වෙමු. මෙම වන්නම ගායනා කරන්නේ හා නර්තනය කරන්නේ මාත්‍රා 3 තාල රූපයටයි.

ඉහත ආකාරයට වන්නමේ බෙර පදය තානම හා කවිය ගායනයෙන් පසු කස්තිරම , සීරුමාරුව හා අඩව්ව යන කොටස් ද තාල තබා පද කියා පසුව සම්පූර්ණ වන්නම නර්තනය කරමු.

කස්තිරම : රුඳ ගත ගත ගත කුකුදත් - ගජිංත ගත් ජිත් කුංදත්
තකුද ගජිං තකුද ගජිං තකුඳ ගතට ගත කුඳ කුඳ
ගජිංත ගත් ජිත් කුංදත් - තකු තක තරිකිට කුංදත් තා

සීරුමාරුව : තකට දොදොංතා කුංදත් තරිකිට තකට දොදොම් තා

අඩව්ව : ගත්ත තෙහිඟු තකට තකුඳ - තක්කඩ ජික්කඩ කඩතක තකට තකුඳ
ගතකු තෙහිඟු තකට තකුඳ
තත් තත්කඩ තරිකිට - ජිත් ජික්කඩ තරිකිට - තොං තොංකඩ තරිකිට නං.

## 2- සිංහරාජ වන්නම

සිංහරාජ වන්නම අනෙක් වන්නම්වලට වඩා කෙටි වන්නමකි. උඩරට වන්නම් 18 අයත් එකම උපදේශාත්මක වන්නම සිංහරාජ වන්නමයි. මාත්‍රා 4 තාල රූපයට ගායනා කරන වන්නමට අතීත ජන කථාවක් තේමා වී ඇත. මුලින් ම අපි වන්නම තාලානුකූලව ගායනයට හුරු වෙමු.

තිත : මාත්‍රා 4 තාල රූපය (මහ තනි තිත)

බෙර පදය : දොදොංත තකු දොම්

තානය : තනත් තනෙන තම් දනත් තනෙන තම්, තනත් තනෙන තම් දන තා- නා- තන
තනත් තනෙන තම් දනත් තනෙන තම්, තනත් තනෙන තම් දන තා- නා

කවිය : පෙරත් කලෙක සිහ රජෙක් වැටුණු මහ ළිඳක් තුළක ඉඹි ලඩෙක් කරපු වැඩ
ඇරත් මෙහෙම යස වැඩක් වුණේ නැත චිරත් කලෙක පැවතුමක් යසයි හැඩ
දුරත් බැලුම නොම ළඟත් බලන අය හටත් මෙලෙස මම කැටත් තබමි දඩ
වටත් අයට දැනෙනටත් කියමි මම රටක් වටින සිහ රජ වන්නමෙ හැඩ

කස්තිරම : තකට තකට තක තරිකිට කුංදත්///
රුංතක ජිංතක තරිකිට කුන්දත්///
තා ගජිං තක තරිකිට කුංදත්//
රුංතක ජිංතක තරිකිට කුංදත් තා (කඩතක)

සීරුමාරුව : තකු තක ජිජිකුද ගජිත ගජිත කුද ගජිගත
දොද් දොම් තා//
දොද් දොම් තාකු ජිත්ත ගත දොම්කිට
තරිකිට කුංදත් තාෙ

අඩව්ව : තත් තොග තක තොග තත්කඩ තරිකිට තක තොග
තකට ජිකට තොග ජික්කඩ තරිකිට තක තොග
තාකු ජිත්ත ගත දොම්කිට තරිකිට කුංදක් තා.

**සිංහරාජ වන්නම ගායනය**

| තිත | /<br>1 2 3 4 | /<br>1 2 3 4 | /<br>1 2 3 4 | /<br>1 2 3 4 |
|---|---|---|---|---|
| බෙරපදය | දො දොං - ත | ත කු දො<br>ම් | දො දොං - ත | ත කු දො<br>ම් |
| තානම | + ත නත්<br>ත<br>+ ත නත්<br>ත<br>+ ත නත්<br>ත<br>+ ත නත්<br>ත | නෙ න තම්<br>-නෙ න තම්<br>-නෙ න තම්<br>-නෙ න තම්<br>- | + ද නත්<br>ත<br>+ දන තා<br>-+ ද නත්<br>ත<br>+ දන නා<br>- | නෙ න තම්<br>-<br>නා - ත<br>න<br>නෙ න තම්<br>-<br>නා - -<br>- |

වන්නම් නර්තනය කරන සාමාන්‍ය ආකාරය වන්නේ මුලින්ම ගී මණ්ඩියේ සිට (මණ්ඩියේ සිට දකුණු කකුළ මදක් ඉදිරියට තබා) තානම ගායනා කරමින් දෑතින් තාලානුකූලව වලන දැක්වීමයි. ඉන් පසු අලංකාර මාත්‍රා නර්තනය කළ යුතුයි. සෑම කවියක්ම ගී මණ්ඩියෙන් වලන දක්වා එකින් එක තානම ගයමින් අලංකාර පද නර්තනය කරයි.

ඉන් අනතුරුව කස්තිරම , සීරුමාරුව හා අඩව්ව යන කොටස් නියමිත අංගහාර ලක්ෂණවල සිටිමින් නිවැරදිව නර්තනය කළ යුතුය. ඔබගේ නර්තන ආචාර්යවරයා හෝ ආචාර්යවරියගේ උපදෙස් මත සිංහරාජ වන්නම අදාල තිත් රූපයට ගායනා කර අලංකාර පද නටමින් නර්තනය කරන්න.

**වන්නමක් නර්තනයේ දී**

- **අදාල තිත් රූපයට ගැලපෙන ලෙස දෑත් චලනය හා අලංකාර පද පෑගීම කළ යුතුය. උදාහරණ ලෙස සිංහරාජ වන්නමේ නම් දෑත් හෝ පාද තැබිය යුත්තේ මාත්‍රා හතරෙන් හතරටය.**
- **ගායනා කරමින්** නර්තනය **කළ යුතුය**
- **නිවැරදි අංගහාර ලක්ෂණ සහිතව** නර්තනය **කළ යුතුය.**
- **සාම්ප්‍රදායික ගොඩ සරඹ ඒ ආකාරයෙන්ම** නර්තනය **නොකර සම්ප්‍රදායට ගැළපෙන ලෙස අලංකාර මාත්‍රා** නිර්මාණය **කරගත හැකිය.**
- **කස්තිරම , සීරුමාරුව හා අඩව්වට අයත් පද කොටස් සාම්ප්‍රදායික ආකාරයටම** නර්තනය **කළ යුතුය.**

ඇගයීම

**ලිඛිත අභ්‍යාස**

1. උඩරට සම්ප්‍රදායේ වන්නම් 18 පිළිබඳ කරුණු සොයාබලා කෙටි සටහනක් ලියන්න.
2. වෛරොඩි වන්නම අදාල තිත් රූපයට අනුව ප්‍රස්ථාර කරන්න.
3. සිංහ රාජ වන්නම කුමන සනයේ වන්නමක් ද?
4. සිංහ රාජ වන්නමේ කවිය හා කස්තිරම අදාල තිත් රූපයට ප්‍රස්ථාර කරන්න.

**ප්‍රායෝගික ක්‍රියාකාරකම්**

1. **වෛරොඩි වන්නම හා සිංහරාජ වන්නම තාලානුකූලව ගායනයට හුරු වන්න.**
2. **වන්නමේ සියළු කොටස් කටපාඩම් කරගන්න.**

සැකසුම -W.D.ප්‍රියංගා ජයසූරිය, ර/නිවි/හංගමුව ශ්‍රී රත්නෝදය මහා විද්‍යාලය. රත්න හංගමුව.